**අම්බලන්ගොඩ නගර සභාව- 2022**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අම්බලන්ගොඩ නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අම්බලන්ගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ණයහිමියන් 875,000 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගතකළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.1,677,267 ක් වූ දෘඩාංග උපාංග හා ජාල උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගෙන තිබූ ලී බඩු හා සවිකිරීම් රු.106,680 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි. | - එම - | - එම - |
| (ඈ) | ඉකුත් වර්ෂයේ දී හා සමාලෝචිත වර්ෂයේ දී කලින් ලද කඩ කුලී ගැලපීම් නොකිරීමෙන් සමාලෝචිත වර්ෂයේ කඩ කුලී ආදායම රු.192,060 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | - එම - | - එම - |
| (ඉ) | ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබිය යුතුව තිබූ රු.400,616 ක ස්ථාවර තැන්පත් පොළිය සමාලෝචිත වර්ෂයේ ආදායමට හර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම හා ස්ථාවර තැන්පත් වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම් ගතකළ යුතු වේ. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු බිල් කිරීම් රු.441,000 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | - එම - | - එම - |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 10 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.5,846,202 ක වෙනසක් විය. | වෙනස්කම් සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතු වේ. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.24,857,312 ක් වූ ගිණුම් විෂයයන් 11 ක් අවශ්‍ය විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ඉදිරියේ දී උපලේඛන ලබා දීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

**1.7 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

මුදල් රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | තත්කාර්ය අතුරු අග්‍රිම සඳහා ලබාගත් රු.290,564 ක අත්තිකාරම් පියවා නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.19,158,420 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.35,006,166 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 24,050,000 | 23,950,355 | 24,696,404 | 35,222,523 | 24,090,000 | 20,268,799 | 15,642,125 | 35,968,572 |
| කුලී | 23,601,250 | 17,835,503 | 18,140,843 | 11,953,730 | 21,329,000 | 13,971,870 | 14,621,797 | 12,259,070 |
| බලපත්‍ර ගාස්තු | 604,000 | 375,494 | 431,844 | 225,909 | 1,273,000 | 616,950 | 590,600 | 282,259 |
| වෙනත් ආදායම් | 22,995,000 | 21,229,464 | 20,205,294 | 3,384,107 | 22,068,957 | 15,980,173 | 15,770,286 | 2,359,937 |
| එකතුව | 71,250,250 | 63,390,816 | 63,474,385 | 50,786,269 | 68,760,957 | 50,837,792 | 46,624,808 | 50,869,838 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක් වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ බදු කුලී ශේෂය රු.12,259,070 ක් වූ අතර, වර්ෂය අවසානයට එය රු.11,953,730 ක් විය. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතු වේ. |
| (ආ) | හිඟ වරිපනම් බදු ශේෂය තුළ රු.100,000 ට වැඩි ඒකක 43 කින් රු.7,999,708 ක හිඟ ශේෂයක් විය. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව. | - එම - |
| (ඇ) | අම්බලන්ගොඩ බස් නැවතුම්පොළ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 23 ක ගිවිසුම් කාලය 2018 හා 2020 වර්ෂයේ දී කල් ඉකුත් වී තිබුණු අතර, ඒවා යාවත්කාලීන කර නොතිබුණි. | ගිවිසුම් අලුත් කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වෙනුවෙන් රු.63,750,924 ක් ලැබිය යුතුව තිබුණි. | 2022 වර්ෂය සඳහා උපලේඛන ලැබී නොමැති බැවින් වෙන් කිරීම් කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් ගෙන්වා ගත යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 වර්ෂයේ දී නගර සභා ප්‍රතිපාදන යටතේ රු.353,948 ක් වැය කර කසළ වෙන් කිරීමේ මධ්‍යස්ථානයක් හා රු.429,350 ක් වැයකර ගොඩනැගිලි දෙකක් ඉදිකර තිබුණ ද, මාදම්පාවිල අභය භූමියට අයත් අක්කර 03 ක් වූ හල්වතුර නැමති ඉඩමේ දිනකට ටොන් 18 ත් 20 ත් අතර ප්‍රමාණයක දිරන හා නොදිරන කසළ තුනී කරනු ලැබේ. මෙම කසළ වසරකට වරක් පස් දමා වැසීම සිදු කර තිබූ අතර, කසළ කළමනාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් සභාව සතු නොවී ය. | කළමනාකරණ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට යෝජනා ඉදිරිපත් වී ඇති බව. | කසළ කළමනාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් සකස් කළ යුතු වේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂ සඳහා ලේඛනගත කර තිබූ ත්‍රීරෝද රථ 194 ක් සඳහා බලපත්‍ර ගාස්තු අය කරගෙන නොතිබුණි. | කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කරන බව. | ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.3 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ විද්‍යුත් පුස්තකාලයේ පරිගණක 10 ක්, යතුරු පුවරු 11 අක්‍රිය තත්ත්වයේ පැවතුණු අතර, ඒවා අළුත්වැඩියා කර, පුස්තකාල සේවා සැපයීම සඳහා යොදා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණු අතර, විද්‍යුත් පුස්තකාල කටයුතු ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණි. | පාඨකයාට අන්තර්ජාලය තුලින් තොරතුරු ගවේශනයට අවශ්‍ය පහසුකම් සැපයීමට කටයුතු කරන බව. | ඩිජිටල් පුස්තකාලය ක්‍රියාත්මක කළ යුතු වේ. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවය කර, සේවය හැර ගිය සහ වැඩ තහනමට ලක් වූ ස්ථිර නොවන සේවකයන් 66 දෙනෙකුගෙන් දෙසැම්බර් 31 දිනට අය නොවී පවතින රු.167,942 ක ණය ශේෂයක් පැවතුණි. | සේවකයින්ගේ විස්තර සොයාගත නොහැකි බව. | අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ අයවැය ලේඛනය සභා සම්මත කර නොගැනීම හේතුවෙන් වාර්ෂික අයවැය ලේඛනයට ඇතුළත් මහජන යෝජනා සඳහා වෙන් කළ රු.13,000,000 ක් වූ ව්‍යාපෘති 172 ක් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණි. | 2022 වර්ෂයේ අයවැය යෝජනාවල සඳහන් වූ ඉටු නොකරනු ලැබූ සංවර්ධන යෝජනා 2023 වර්ෂය සඳහා වන අයවැය යෝජනාවලට ඇතුලත් කර ඇති බව. | වාර්ෂික අයවැය යෝජනා ක්‍රියාත්මක කල යුතු වේ. |